Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 12

විෂයය:- කෘෂි හා ආහාර තාක්ෂණය

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

1. සත්ව නිෂ්පාදන ආනයනය සඳහා යන වියදම් අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 5ක් යෝජනා කරන්න.

2. සත්ව පාලනය රටතුල තවදුරත් දියුණු කිරීමට රජය මගින් හා පෞද්ගලික අංශයෙන් ලබාදෙන සහන සහ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.( ඔබේ පහසුවට - සතුන් රක්ෂණය කිරීම)

8.2 නිපුනතාව

* ගොවිපොල සතුන් තේරීම.

"ගොවිපොල සතුන් ප්‍රධාන වශයෙන් කාණ්ඩ දෙකකට වර්ග කරයි.'

1 සම්භවය අනුව

2 ගන්නා ප්‍රයෝජන අනුව

1) සම්භවය අනුව ප්‍රධාන කාණ්ඩ දෙක නම් කරන්න. ( බ්‍රවුන් ස්විස් ගව වර්ගය යුරෝපීය සම්භවයක් ඇත)

2) සම්භවය අනුව එම ගව වර්ග දෙකෙහි දක්නට ලැබෙන සුවිශේෂි ලක්ෂණ වගුවක දක්වන්න.

3) ඉහත ආකාරයට ගන්නා 'ප්‍රයෝජන අනුව" ද ගවයින් වර්ගකර දක්වන්න. ( ශමය සඳහා ඉන්දීය සතුන් යෝග්‍යයි - හෙරිෆඩ් ගව වර්ගය මස් පිණිස ඇති කරයි )

4) ගව වර්ග පිළිබද තවදුරටත් දැනුවත් වෙමු.

ඔබ ඉහතින් හදුනාගත් එක් එක් ගව වර්ග පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.(වර්නය, නිෂපාදනය, නිෂ්පාදන ප්‍රමානයන්, බර, උපන් රට , වෙනත් ලක්ෂණ)

5) ලංකාවේ ඇති කිරීමට වඩා යෝග්‍ය දෙමුහුන් ගව වර්ගය. එවැනි දෙමුහුන් ගව වර්ග පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න. ( සතුන් දෙමුහුම් කිරීම පිළිබඳ තව දුරටත් සොයන්න )

"බීෆ්මාස්ටර් ගව වර්ගය හෙරිෆඩ් ෂෝර්ට්හෝර්න් බහ්මන් සතුන් මුහුන් කිරීමෙන් ඇතිකර තිබේ"

6) ලංකාවේ කිරි නිෂ්පාදනය පිණිස ඇති කරනු ලබන මී ගව වර්ග පිළිබද පහත සඳහන් තොරතුරු එක්රැස් කරන්න. ( උපන් ප්‍රදේශය, පැහැය, බර,කිරි නිෂ්පාදනය, වෙනත් විශේෂ ලක්ෂණ.)ව

7) ශ්‍රමය සඳහා වඩා යෝග්‍ය ඉන්දීය සතුන්ය. ඔවුන් පිළිබද තොරතුරු රැස්කරන්න.